# ඇයට යුක්තිය ඉටුකරනු සඳහා

මනුෂ්‍යයෙකුට හිමිවූ භෞතික මෙන්ම අභෞතික අංගෝපාංගයන්ගෙන් සමන්විතව ලොවට බිහිවන ''කාන්තාව'' පොදු සමාජයේ සුළු පිරිසකගේ අවශ්‍යතා, හැඟීම් මෙන්ම මනෝමූලික අදහස්ද සාක්ෂාත් කරමින් ඉතා පහත් තත්වයකට තල්ලුකිරීම මනුෂ්‍යත්වය වෙත හෙලන අකාරුණික බැල්මක් වශයෙන් හැඳින්විය හැක. මිනිසෙකු වශයෙන් පුරුෂයාට ඇති සියළුම හැකියාවන් වන දියුණු මනස හා භෞතික ප්‍රවාරයන් කාන්තාවටද හිමිවී ඇත. එසේ නම් ''කාන්තා විමුක්තිය'' යන මාතෘකාවට වැරදි නිර්වචන සැපයීම අපට තරම් නොවේ.

ලෝකයේ විවිධ රටවල අඩු වැඩි තරමින් අද පවා ක්‍රියාත්මක ගනිකා වෘත්තිය වැනි සමාජ අපචාරී කටයුතු වල මූලාරම්භය සොයන සමාජ හා මානව විද්‍යාඥයින් අදහස් කරන්නේ එහි මූලාරම්භක කරුණු කෙරෙහි කාන්තාව වෙත එල්ල කල ද්වේෂ සහගත හැඟීම් හේතුවී ඇති බවයි. කිංස්ලි ඩේවිස් නම් සමාජ විද්‍යාඥයා බොල්ෂේවික් විප්ලවයෙන් පසු රුසියාවේ ගනිකා වෘත්තිය පිළිබඳව කතා කරමින් කියන්නේ ''එම භාරදූර කාර්යයෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවගේ භෞතික මෙන්ම අභෞතික අවශ්‍යතාවයන්ද සමාජය විසින් ලබාදී කාන්තාව පිළිබඳව ඇතිවී තිබුනු වැරදි මත නැතිකිරීමත් සමගම ගනිකා වෘත්තිය ගැන කතා කිරීමට තරම් නොවන පරිදි එය පහළ වැටුනු බවයි.''

**පුරුෂයාට මේ සමාජය තුළ හිමිවූ තත්වයම කාන්තාවටද ලබාදිය යුතුය. එය ප්‍රශ්නයක් නොවේ. එහෙත් කාර්ය භාරයන් සංවිධිතව යෙදවීමේදී මෙහි යම් යම් අසාධාරණතාවයන් මතුවී ඇත. ප්‍රාග් බෞද්ධ ඉන්දියානු සමාජයේ කාන්තාවගේ විවිධ අයිතීන් බමුණන්ගේ මනෝමූලික හා ද්වේෂ සහගත අදහස් පෙරදැරි කරගෙන උදුරා ගත් බව පෙනේ. එහෙත් ඊටත් ඇත මොහෙන්ජදාරෝ හා හරප්පා ශිෂ්ඨාචාරවල කාන්තාව සශ්‍රීකත්වයේ සංකේතය වශයෙන් සලකමින් දේවත්වයෙන් ගරු සැලකිලි ලැබූ බව පුරාවිද්‍යා කැනීම් ශාක්ෂි දෙයි.**

පශ්චාත් කාර්මික කරණයට පත්වූ ඇමරිකාව, බටහිර යුරෝපය වැනි රටවල් උදහරණයට ගත්තද ගෝත්‍රික සමාජ වශයෙන් පවතින දකුණු අප්‍රිකානු රටක් ගත්තද කාන්තාව වෙත සිදුවී ඇති අසාධාරණය

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි.

**රංජිත් කුමාරසිරි පතිරණ**

මැනවින් කැපී පෙනේ. ඇය සමාජය තුළ උප්පත්තියෙන්ම පහත් ස්ථානයක් හිමිකරගෙන ඇත. ඇයට තම පතිවෘත්තාව රක්ෂාකර ගැනීමට තරම් දියුණු මනසක් නැත. සමාජය තුළ පුරුෂයාට හිමිවී තිබෙන ආර්ථික හෝ සමාජ වරප්‍රසාදයන් ඒ හැටියෙන්ම ඇයට හිමිවිය යුතු නැත. යනුවෙන් සමාජය පුරා වැරදි තීරණ පතුරුවා හරිමින් ඇගේ විමුක්තිය කෙරෙහි වැරදි නිර්වචන ඉදිරිපත් කිරීම සාධාරණ නොවේ.

කාන්තාවගේ අයිතිවාසිකම් කෙරෙහි සමාජ හා මානව විද්‍යාඥයින් හෙලන දෘෂ්ටි කෝණය මීට හාත්පසින්ම වෙනස්වූවකි. සෑම සමාජයකම කාර්යභාරයන් පැහැදිලිව හඳුනා ගැනීමටත්, ඒවා පැහැදිලිව ක්‍රියාත්මක කිරීමටත් පහසුවන පරිදි සංස්ථා රටාවක් බිහිවී ඇත. පවුල නමැති සංස්ථාව ආගමික සංස්ථාව, ඥාති කණ්ඩායම



**මිනිසාට සවියක් වන කාන්තාව:** කොන්කිරීමේ වැරැද්ද

නමැති සංස්ථාව මෙයට උදහරණ වශයෙන් දැක්විය හැක. ගෝත්‍රික සමාජයක ක්‍රියාත්මක වන සංස්ථා රටාවට වඩා වෙනස් මුහුණුවරකින් නවීන සමාජයක සංස්ථා රටාව විසින් පුරුෂයාට හිමි කාර්ය භාරයන්, ස්ත්‍රියට හිමි කාර්ය භාරයන් පැහැදිලිව හඳුනාගෙන ඇත. එය කාන්තාවගේ හෝ පුරුෂයාගේ අයිතීන් පිළිබඳව හඬගා කීමක් හෝ කඳුලු සලා හැඬීමක් නොව සමාජ අවශ්‍යතාවයන් බව පෙනේ. එය සමාජ සංස්ථාවන්ගේ ගැටුම් වලින් තොර බවට මෙන්ම සමස්ත සමාජ පරිනාමය නැමැති ක්‍රියාවලියේ අවස්ථාවක් වශයෙන්ද හැඳින්විය හැක.

උදහරණ වශයෙන් ප්‍රාථමික සමාජයක් ගත් කළ එහි පවුල නමැති සංස්ථාව තුළ ස්ත්‍රියට සහ පුරුෂයාට හිමි කාර්ය භාරයන් ඇත. පුරුෂයා දඩයම් කිරීම, සටන් කිරීම ආදී බර වැඩෙහි යෙදෙන අතර ස්ත්‍රිය විසින් දරුවන් රැකබලා ගැනීම හා ගෘහ කර්මාන්තයෙහි නිරත වීම සිරිත වේ. එහෙත් පශ්චාත් කාර්මික කරණයට පත්වූ රට වල පවුල නමැති සංස්ථාවේ කාර්ය භාරයන් අතර ගැටුම්කාරී ස්වරූපයක් දක්නට ලැබේ. පවුල තුළ ස්වාමියා මෙන්ම භාර්යාවද ශ්‍රමිකයන් වශයෙන් කටයුතු කිරීම නිසා පවුල තුළින් ඉටුවිය යුතු දරුවන් රැකබලා ගැනීම වැනි කටයුතු ළමා නිවාස වැනි ආයතනයන් වෙත පවරා දීමට සිදුවේ. මෙය කාන්තාවගේ කාර්ය භාරයන් අතර ගැටුම්කාරී ස්වරූපයක් එල්ල වන අවස්ථාවක් වන අතර අනාථ ළමුන්, සමාජ අපචාරී කල්ලි සංස්කෘතීන් බිහිවීමට මෙය අවස්ථාවක් බව සමාජ අපරාධ විද්‍යාඥයින්ගේ මතය වේ.

ඒ ඒ සමාජයන්හි සමාජ සංස්ථාවන් වෙත පැවරී ඇති කටයුතු වෙනත් ආයතන වෙත ගැටුම්කාරී පසුබිමක් යටතේ පවරාදීම සැබෑ කාන්තා විමුක්තියක් නොවේ. එවැනි 'පසුබිමක් යටතේ ඒ සම්බන්ධව ඉදිරිපත් කරන නිර්වචනයන් තුළ ඇත්තේද සාවද්‍ය බවකි. මේ හැර කාන්තාවට පුරුෂයාට මෙන්ම සමාන අධ්‍යාපනයක් ලබා දිය යුතුය. ආගමික හෝ දේශපාලන නිදහසත් ලබා දිය යුතුය. යනුවෙන් ඉදිරිපත් කරන සටන් පාඨ පිළිබඳව තර්කයක් නැත. සමාජය තුළ පුරුෂයා භුක්තිවිඳින සියළුම අයිතිවාසිකම් ඇයටද හිමිවිය යුතුය. එහෙත් එය ඒ ඒ සමාජයන්හි සමාජ සංස්ථා රටාවේ ක්‍රියාවලි පද්ධතියට හානියක් නොවන පරිදි ඉටුවන්නේ නම් එය සැබෑ කාන්තා විමුක්තියක් වශයෙන් හැඳින්විය හැක.